සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය<br>இரண்டாம் தவணைப் பரீட்சை 2021<br>Second Term Test 2021 | 9 ශ්‍රේණිය<br>தரம் 9<br>Grade 9 |
| කතෝලික ධර්මය | පැය 2 යි<br>2 மணி<br>2 hour |

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(01)

1. ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමේ පොත් බෙදෙන කොටස් ගණන වන්නේ,
   (1) 03 කි (2) 04 කි (3) 05 කි (4) 06 කි

2. නව ගිවිසුමට අයත් සංදේශයක් නොවන්නේ,
   (1) ගලාති (2) පිලිප්පි (3) තීතස් (4) ජෝබ්

3. "සමිඳුනී, මාගේ කන්නලව්වට සවන්දුන මැනව." ගීතාවලියෙහි සඳහන් මෙම ගීතය අඩංගු කාණ්ඩය වන්නේ,
   (1) විලාප ගීතිකා (2) තුතිදීමේ ගීතිකා
   (3) ප්‍රඥා ගීතිකා (4) රාජකීය ගීතිකා

4. "දුක්ප්‍රාප්තියේ සුබාරංචිය" වන්නේ,
   (1) මතෙව් සුබාරංචියයි (2) මාක් සුබාරංචියයි
   (3) ලූක් සුබාරංචියයි (4) ජොහාන් සුබාරංචියයි

5. "ලෝකයේ ..........මම වෙමි." හිස්තැනට ගැළපෙන වචනය වන්නේ,
   (1) ජීවනය (2) දොරටුව (3) එඬේරා (4) ආලෝකය

6. දුර්පරීක්ෂා වලට නොවැටී ඒවා ජය ගැනීම සඳහා
   (1) වැඩිහිටියන්ට සවන් දිය යුතුය (2) යහපත් සිතුවිලි ඇතිව සිටිය යුතුය.
   (3) ශුද්ධ බයිබලය කියවිය යුතුයි (4) හෘද සාක්ෂියට සවන් දී ක්‍රියා කළ යුතුය

7. ජල ගැල්ම පැමිණෙන විට නෝවාගේ වයස,
   (1) 500 කි (2) 600 කි
   (3) 700 කි (4) 800 කි

8. වීර නායකයෙක් නොවන්නේ,
   (1) ඒහුද් (2) තෝලා (3) මීරියම් (4) දෙබෝරා

9. ඉශ්‍රායෙල් දේශයේ ප්‍රථම රජු වන්නේ
   (1) දාවිත් ය (2) සාමුවෙල් ය (3) සලමොන් ය (4) සාවුල් ය

10. දාවිත්ගේ පියා වන්නේ,
    (1) ජෙත්රෝ ය (2) ජෝශප් ය (3) ජෙස්සේ ය (4) ජායිර් ය

11. ජේසුස් වහන්සේ විසින් "නැවතත් පව් නොකරන්න." ලෙස පවසන්නේ,
    (1) පව්කාර ස්ත්‍රියට ය (2) සකේවුස්ට ය
    (3) අංශභාග රෝගියාට ය (4) ජුදාස්ට ය

12. අපගේ ඇදහිල්ලේ ස්ථිරව සිටීමට නම්,
(1) යාච්ඤා කළ යුතුය (2) පාපය බැහැර කළ යුතුය
(3) පාපොච්චාරණය කළ යුතුය (4) දුක් මනස්ථාප විය යුතුය

13. "ඔබ අතුරෙන් යමෙක් රෝගී ව සිටින්නේ නම්, ඔහු සභා මූලිකයන් කැඳවා ගනීවා." මෙසේ සඳහන් වන්නේ,
(1) පේදුරු ලිපියේය (2) ජාකොබ් ලිපියේය
(3) ජොහාන් ලිපියේය (4) ජොහාන් සුබාරංචියේය

14. ආරම්භක දේව ප්‍රසාද නිධානයක් නොවන්නේ
(1) ප්‍රසාද ස්නාපනය (2) පාපොච්චාරණය
(3) දිව්‍ය සත්ප්‍රසාදය (4) අභිවෘද්ධි ආලේපනය

15. "අපගේ ජීවිත ශුද්ධාත්මයාණන්ගේ මන්දිර වන නිසා,
(1) අප ජීවිත ශුද්ධත්ව ගත කළ යුතුය (2) සමබර ආහාර වේලක් ගත යුතුය
(3) පිරිසිදුවට සිටිය යුතුව (4) ආදර්ශමත්ව ජීවත් විය යුතුය

16. "ජීවිත විනාශ නොකිරීම" යනු
(1) හතරවන පනතයි (2) පස්වන පනතයි (3) හයවන පනතයි (4) හත්වන පනතයි

17. තම සහෝදරයාට "ජඩයා" කියා ගරහන අයට සිදු වන්නේ,
(1) අධිකරණයට යටත් වනු ඇත (2) ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වනු ඇත
(3) ස්වර්ගය අහිමි වීම (4) නිරා ගින්නට ගොදුරු වීම

18. නව මැවිල්ලේ ආරම්භකයා වශයෙන් දෙවියන් වහන්සේ තෝරා ගනු ලැබුවේ,
(1) ආබ්‍රහම්ය (2) මෝසෙස්ය (3) නෝවාය (4) ආදම්ය

19. නැවත නැවත ලැබිය හැකි දේව ප්‍රසාද නිධානයක් නොවන්නේ,
(1) දිව්‍ය සත්ප්‍රසාදය (2) පාපොච්චාරණය
(3) රෝගීන්ගේ ආලේපනය (4) ප්‍රසාද ස්නාපනය

20. ශු. අගෝස්තීනු මුනිතුමාගේ මව වන්නේ.
(1) ශු. මොනිකා තුමියයි (2) ශු. බර්බරා තුමියයි
(3) ශු. ආනා තුමියයි (4) ශු. එලිසබෙත් තුමියයි

(ලකුණු 20x2=40)

## II කොටස

- ප්‍රශ්න 5 කට පමණක් පිළිතුර ලියන්න.

(01) 1. නව ගිවිසුමෙහි අඩංගු පොත් ගණන කොපමණද?
2. නව ගිවිසුම බෙදෙන ප්‍රධාන කොටස් 03 ක් නම් කරන්න.
3. "නව ගිවිසුමේ පොත් වර්ගීකරණය" පිළිබඳ වචන 75 කින් පමණ විස්තර කරන්න.

(2+4+6 = 12)

(02) 1. වීර නායකයින් සිටි කාල සීමාව ලියන්න.
2. වීර නායකයින්ගේ මූලික කාර්යය ලියන්න.
3. වීර නායකයින්ගෙන් ඔබට ගත හැකි ආදර්ශ 03 ක් ලියා විස්තර කරන්න.

(2+4+6 = 12)

(03) 1. ජන්ම පාපය යනු කුමක් ද?
2. මුල් අගුණ පාප 04 ක් නම් කරන්න.
3. පාපයෙන් වැලකී ශුද්ධවන්ත ජීවිතයක් ගත කරන ආකාර 03 ක් නම් කර විස්තර කරන්න.

(2+4+6 = 12)

(04) 1. පාපයට ලැබෙන දඬුවම් දෙවර්ගය නම් කරන්න.

2. එම දඬුවම් දෙවර්ගය කෙටියෙන් විස්තර කරන්න.

3. පාපොච්චාරණය කිරීමේ පිළිවෙත පිළිවෙළින් විස්තර ලියන්න.

(2+4+6 = 12)

(05) 1. අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම්වලට අනුව රෝගීන්ගේ ආලේපය දානය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?

2. රෝගීන්ගේ ආලේපනය ලැබිය හැකි අය දෙදෙනෙකු නම් කරන්න.

3. රෝගීන්ගේ ආලේපනය නැමති දේව ප්‍රසාද නිධානය මගින් ලැබෙන වරප්‍රසද 03 ක් ලියා කෙටියෙන් විස්තර කරන්න.

(2+4+6 = 12)

(06) 1. වර්තමාන සමාජය තුළ දක්නට ලැබෙන පාපී ක්‍රියා දෙකක් නම් කරන්න.

2. වරදට වැටුණු කායින්ට දෙවිපියා දුන් දඬුවම් 02 ක් ලියන්න.

3. වර්තමාන සමාජය තුළ දක්නට ලැබෙන පාපී ක්‍රියා නැති කිරීමට පාසල් දරුවෙකු ලෙස ඔබේ යාළුවෙකුට දෙන උපදෙස් 03 ක් ලියා විස්තර කරන්න.

(2+4+6 = 12)

(07) 1. පහත මාතෘකා අතරින් දෙකක් තෝරා ගෙන වචන 75 කට නොඅඩු කෙටි සටහනක් ලියන්න.

i. ශුද්ධ බයිබලයේ ග්‍රන්ථ වර්ගීකරණය

ii. ගීතාවලිය

iii. ජොහාන් සුබාරංචිය

iv. නැතිවුණ පුත්‍රයාගේ උපමාව